මගේ අංකය-027/01/01
නේවාසික ව්‍යාපෘති කාර්යාලය
පදවිය ව්‍යාපාරය
පදවිය
2019/02/20

ව්‍යාපාර කළමනාකරණ කමිටුව

**ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්ථාව 2019 පෙබරවාරි මාසය**

වාරිමාර්ග අඥාපනතේ 1994 අංක 13 (සංසෝදිත පනතට අනුව)පදවිය නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙබරවාරි මස 20 දින පෙ.ව. 9.00 ට පදවිය නේවාසික ව්‍යාපාර කළමනාකරන කාර්යාලීය රැස්වීම් ශාලාවේ දි ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදි.පැමිණ සිටි සියලුදෙනා පිළිගත් නේවාසික ව්‍යාපාර කළමනාකරු එන්. වසන්ත මහතා දිනට නියමිත න්‍යාය පත්‍රය සභාගත කරන ලදි.

සහභාගි වු රාජ්‍ය නිලධාරින්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | එන්.වසන්ත මහතා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | නේවාසික ව්‍යාපෘති කාර්යාලය |
| 2. | .එම්. ඒච් .එම්.හම්සිම් | වාරිමාර්ග.ඉන්ජිනේරු | වාරිමාර්ග දෙපාර්මේන්තුව |
| 3. | එස්.එම්.ඩි .එන්.සෙනෙවිරත්න | මුලස්ථාන කෘෂි උපදේශක | කෘෂිකර්ම දෙපාර්මේන්තුව ,පදවිය |
| 4. | කේ.පී.එස්.දිල්රුක්ෂි | සංවර්ධන නිලධාරි | නේවාසික ව්‍යාපෘති කාර්යාලය |
| 5. | | | |
| 6. | ආර්.එම්.එස්.ඩබ්.බන්ඩාර මහතා | සංවර්ධන නිලධාරි | නේවාසික ව්‍යාපෘති කාර්යාලය |
| 7. | එස්.පී.බී.එස්.ඒ.ශාන්ත | ඉන්ජිනේරු සහකාර | වාරිමාර්ග දෙපාර්මේන්තුව |
| 8. | ජී.එන්.සි.ගුණරත්න | තාක්ෂණ සහයක | කෘෂිකර්ම දෙපාර්මේන්තුව ,පදවිය |
| 9. | එම්.එස්.පී. පෙරේරා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්මේන්තුව,පදවය |

සහභාගි වු ගොවි සංවිධාන නිළධාරින්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | එන්.පි.එස්.නිශ්ශන්ක | සභාපති | ඉසුරු |
| 02 | එල් පි.ලක්ෂ්මන් | උප සභාපති | අභය |
| 03 | ඩබ්.ජී.වසන්ත අජිත් කුමාර | ලේකම් | පැරකුම් |
| 04 | එච්.ඩී.ධර්මසේන | සභාපති | යාය 6 දුටුගැමුණු |
| 05 | එච්.පී.ධර්මසිරි | ලේකම් | යාය 6 දුටුගැමුණු |
| 06 | එම්.ඒ.අනුර මිරිහාන | සභාපති | යාය 5/6 |
| 07 | එස් ඩයමන් | උප සභාපති | අග්බෝ |
| 08 | ආර්.සුනිල් වික්‍රම | ලේකම් | යාය 5/6 |
| 09 | කේ.කේ.සේරසිංහ | ලේකම් | ඉසුරු |
| 10 | එම්.එම්.සුනිල් | සභාපති | අරුණ |
| 11 | ඒ.ඒ.අමරසිංහ | ලේකම් | අභය |
| 12 | එච්.ටී.තුෂාර ප්‍රියදර්ශන | ලේකම් | ගැ/තිස්ස |
| 13 | එම්.ජී.සි.කේ.ජයකොඩි | භාණ්ඩාගාරික | සිංහ |

| | | | |
|---|---|---|---|
| 14 | එම්.ආර්.එච්.ආර්.කුමාර | සභාපති | සේවා |
| 15 | පී.ජී.කපිල බන්ඩාර | භාණ්ඩාගාරික | ගැ/තිස්ස |
| 16 | ඒ.එම්.සෙනරත් බන්ඩාර | සභාපති | විජයභා |
| 17 | පී.බී.ලයනල් ප්‍රේමතිලක | සභාපති | සිංහ |
| 18 | අශෝක මද්දුම බන්ඩාර | සභාපති | සුභද |

## පසුගිය ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය

අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තිරණය විය.

**අරමුන පැහැදිලි කිරිම** - නේවාසික ව්‍යාපාර කළමනාකරු එන්.වසන්ත මහතා ව්‍යාපාර කළමනාකරණ කමිටුවට පැමිණි සිටි රාජ්‍ය නිළධාරින් හා ගොවි සංවිධාන නිළධාරින් පිළිගත් අතර දැනට වගාව සම්බන්ධ පවතින තත්වය පිලිබදවත්.ආයතන සංවර්ධනය,වාරිමාර්ග අංශය ජලය බෙදා හැරීමේ ක්‍රියාවලියට සම්බන්ද වීම .නඩත්තු මෙහෙයුම් කරන ආකාරයත්.කෘෂිකර්ම සැලසුම් හා ප්‍රගතිය පිළිබදවත්,ගොවිජන සේවා පනතේ සියලු කටයුතු පිළිබදවත් යං ඔය ව්‍යාපෘතියේ විශේෂත්වය පිලිබදවත් කරුනු අවධානය යොමු කරමින් වාරිමාර්ග දෙපාර්මේන්තුවෙන්,කෘෂිකර්ම දෙපාර්මේන්තුව,ගොවිජනසේවා දෙපාර්මේන්තුව ලැබිය යුතු විශේෂ කරුණු පිලිබදව වැඩිදුරටත් සාකච්චා කලයුතුබව අරමුණ පැහැදිලි කරන ලදි.

### 01.ආයතන සංවර්ධන - **නේවාසික ව්‍යාපාර කළමනාකරු**

ගොවි සංවිධාන මාසික මුදල් සාරංශ වාර්තාව මාස්පතා ලැබීම සම්බන්දවත් ,කාරක සභා මාසිකව පැවැත්වීම සම්බන්දවත්,මහ සභා පවත්වා ඇති ආකාරය සම්බන්දවත් ගොවි සංවිදාන වල ප්‍රගතියක් පවතින බවත්.ව්‍යාපාර කලමනාකරණ කමිටුවට සම්බන්ධ විම නිල තල දරන අයට විශේසෂ බවත් පවසන ලදි.

1-1 හොදම ගොවි සංවිධානය තේරීමේ කටයුතු කළ යුතු අතර මෙහිදි ලකුණු දීමේ පිළිවෙලක් ඇති බවත් භාණ්ඩාගාරික සභාපති ලේකම් යන තිදෙනාට අදාළ පොත් පත් ලේඛණ පිළිබදවත් වාරිමාර්ග අංශයේ ඇළවේලි සාදා ඇති ආකාරය පිළිබදවත් වාරිමාර්ග අංශයේ ඇළවේලි සාදා ඇති ආකාරය පිළිබදවත් ලකුණු දීම කරනු ලබයි.විනිශ්චය මංඩලය සදහා වාරිමාර්ග ඉංජිනේරු,කෘෂිකර්ම උපදේශකවරුන්,නේවාසික ව්‍යාපාර කළමනාකරු,ගොවි ජන සේවා ප්‍රාදේශීය නිළධාරින් විනිශ්චය සදහා පත් කෙරේ.පෙබරවාරි 25 වනදා සිට මේ සදහා ක්‍රියාත්මක විය යුතු අතර මෙයින් ඉදිරියට දිස්ත්‍රික් මට්ටමින් සහ සමස්තලංකා මට්ටමින් ඉදිරි තරග කටයුතු පැවැත්වීමට හැකි බවත් පැවසීය .

1-2. නේවාසික ව්‍යාපාර කළමනාකරු - සභාපති., ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන නිල තල දරන තිදෙනාගේ පැමිණීම අනිවාර්ය බවත් පදවිය ව්‍යාපාරයට ජලයෙහි පවතින අස්ථාවරත්වය නිසා ගන්නා ලබනු තීන්දු තීරණ ඉතා වැදගත් බැවින් ව්‍යාපාර කමිටු රැස්වීමට වේලාවට නිතිපතා පැමිණෙන ලෙස ගොවින් කටයුතු කරන ලෙසද ගොවි සංවිධානයේ සියලුම ක්ෂේත්‍ර කටයුතු සදහා සහ කාරක සභා සදහා සංවර්ධන නිලදාරින් සහභාගි කර ගන්නා ලෙසත් පැවසීය.

### 02.වාරිමර්ග දෙපාර්මේන්තුව - ප්‍රාදේශිය වාරිමාර්ග ඉන්ජිනේරු හම්සිම් මහතා.

**2-1**. පදවිය වැවේ ජල තත්තවය 2019.02.20දිනට

ජල ධාරිතාවය - අක්කර අඩි 45737 ජල මට්ටම - අඩි 16.62

මේ දින මිලිමීටර් 1300 ක වර්ෂාපතනයක් ලැබුනු බවත් පැවසීය.

## 2-2.ජල මුර නිකුත් කරන ආකාරය

5-ජල මුරය පෙබරවාරි 25 සිට මාර්තු 05 දක්වා

ජලය නිකුත් කරන ආකාරය වාරි ඉංජිනේරු හම්සිම් මහතා පෙන්වා දෙන ලදි.

2-3.

| ඉදිරිපත්කල අය | කාරණය | තිරණය | වගකිම |
|---|---|---|---|
| මෛත්‍රි,විජය බා,යාය 5/6,අභය, සේවා,පැරකුම්. ගො.සං. සභාපති | ජල කළමනාකරණයේදි වඩාත් සැලකිලිමත් විය යුතු බවත් ජල මුරයඅවසන් කිරීමත් සමග ජලය අවශ්‍ය ද යන්න පැන නැගුනු ගැටලු වලදි තම ගොවි සංවිධාන වලට දින 02 ජලය අවශ්‍ය බව පැවසිය. | ඉදිරි දින දෙක සඳහා ජලය ලබා දීමක් කළ හැකි බව හම්සිම් මහතා පැවසීය. | වා.දෙ. |
| සිංහ ගො.සං. සභාපති සහ සමගි සභාපති | කට්ටි ඉඩම් 480 ක් පවතින අතර දැනට එම ඉඩම් සඳහා ද්‍රවිඩ ජනතාව ගල් දමා යන බවත් එම කට්ටි ඉඩම් ඔවුන්ට පවරා දෙන ලෙසත් ඉල්ලා සිටියේය. | මෙය ගැන සොයා බැලීමක් කර වාරි මාර්ග අංශයෙන් කළ යුතු කටයුතු සිදු කරන බව පැවසීය. | වා.දෙ |
| සියලුම ගො.සං. නිලධාරින් | යල් කන්නයේදි බෙත්ම ක්‍රමයකට යා යුතු බැවින් අනිසි ලෙස ජලය අපතේ නොයැවිය යුතු බවත් තම සීමා මායිම් ආසන්නයේ කුඹුරු අක්කර 1 හෝ ලබා දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදි. | බෙත්ම ක්‍රමය තුළදි ප්‍රශ්ණ වලින් තොර කුඹුරු තෝරා ගත යුතුයි.ගොඩ කුඹුරු වල අතිරේක බෝග වගාව කිරිම උචිත බවත් නේවාසික ව්‍යාපාර කළමනාකරු පැවසීය. | වා.දෙ.සහ නේවාසික ව්‍යාපාර කාර්යාලය |

**2-4** .සෑම ගොවි සංවිධානයකටම මේ වන විට තවත් 30% - 25% ප්‍රමාණයක් ජලය අවශ්‍ය බවත් පෙබරවාරි 25 වන දින අවසාන ජල මුරය නිකුත් කරන බවත් අරපිරිමැස්මෙන් යුතුව ජලය පරිහරණය කිරීම තුළින් අක්කර අඩි 40000 ක් පමන ජලය ඉතුරු කළ හැකි බවත් පැවසීය.තවද 2019 මාර්තු 15 වන දින පදවිය වැව ආශ්‍රිතව පිරිත් සජ්ජායනය සිදු කිරීම සඳහා සියලු ගොවි සංවිධාන එකතු විය යුතු බව නේවාසික ව්‍යාපෘති කළමනාකරු වැඩි දුරටත් පැවසීය.

**3.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව -** මේ දින වල වී වගාවේ දිලීරයක් පැතිර යාමක් දක්නට ලැබෙන අතර එය කොළ පාටට හුරු තිත (.)ක ස්වරූපයක් ගනි.මේ පිළිබද සැලකිලිමත් විය

යුතු අතර හදුනා ගත් දිලීර නාශකයක් භාවිතා කිරීම සුදුසු බවත් එය කල් ගත වුවහොත් හානිය ප්‍රබල වන බව පැවසීය.
.පදවිය ආශ්‍රිතව බඩඉරිගු වගාවේ සේනා දළඹුවාගේ හානියක් නොමැති අතර මින් ඉදිරියට වගා කටයුතු සිදු කිරීමේදි අඩි 2 ක් හෝ 2 හමාරකින් යුතු ඉඩ පරතරයක් තබා වගා ව සිදු කල යුතුය.එවිට වගාව පරීක්ෂා කිරීම පහසු වේ.මීට ඉහතදි මිරිස් වගාවට වැටක් ලෙස බඩ ඉරිගු වගාව භාවිත කළද එය තාවකාලිකව නවතා දමා මිරිස් වගාව තනි වගාවක් ලෙස පවත්වාගෙන යා යුතු බව පැවසිය.බඩ ඉරිගු,සෝයා, කව්පි, රටකජු සහ මුං අමතර බෝග වගාවන් ලෙස කිරිමෙන් හොද ආදායම් තත්වයකට යා හැකි බවත් 15% තෙතමනය අඩු බෝගයන් සදහා රු.45 ඉහල මිලකට අලෙවි කළ හැකි බව පැවසීය. තවද කෘමිනාශක සහ දියර පොහොර භාවිතයෙන් ඉහල අස්වැන්නක් ලබා ගත හැකි බව පැවසීය.මෙවැනි බෝග සදහා රු 180 ක වැනි ඉහල මිලකට යා හැකි බව කෘෂි උපදේශක තුමා වැඩි දුරටත් පැවසීය.4

**4.ගොවිජන සේවා නිලධාරි -** සහභාගි වි නොමැත.

**5.වෙනත්-** ගොවීන් සදහා ණය ලබා දීමක් 2018 වර්ෂයේදි ක්‍රියාත්මක කල අතර ණය පැහැර හැරීම් සිදු වී තිබු වැවින් එය අඩාල වු අතර 2019 වර්ෂය සදහා මහ බැංකුව හරහා පොළිය 6.75% යටතේ ණය වැඩ සටහනක් ක්‍රියාත්මක වන බවත් එයට ගොවින්ට සම්බන්ධ වන බවත් සෙලාන් බැංකු කළමනාකාර මහතා පැවසීය.

**5-1** ඒකාබද්ධ ගො.සං. සභාපති - යාං ඔය ව්‍යාපෘතිය නිසා ගජබා,සීවලි,පැරකුම් යන ගොවිසංවිධාන වල අසාධාරණයක් සිදු වු ගොවින්ට පුර්ණ හානි නොගෙවු නිසා සියලු ගොවි සංවිධාන එකමුතුවෙන් වැඩසටහනක් දියත් කළ යුතු බව පැවසීය.

............................

එන්.වසන්ත
නේවාසික ව්‍යාපාර කළමනාකරු
පදවිය/වාහල්කඩ ව්‍යාපාර
පදවිය

පිටපත

01.අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය කාෘදැඃස
02.අධ්‍යක්ෂ, වාරිමාර්ග දෙපාර්මේන්තුව කාෘදැඃස
03.දිස්ත්‍රික් ලේකම් අනුරාධපුර/ත්‍රිකුණාමලය කාෘදැඃස
04.කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ අනුරාධපුර කාෘදැඃස
05.ප්‍රාදේශිය ලේකම් පදවිය/ශ්‍රිපුර කාෘදැඃස
06.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාෘදැඃස
07.ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් අ/පුර කාෘදැඃස